# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2197/7 – 2020 ඔක්තෝබර් 13 වැනි අඟහරුවාදා – 2020.10.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/COM/04/E/2014/84.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4 (1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2017.08.08 වැනි දින අංක 2031/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2017.07.31 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජල පවිත්‍රාගාර කාර්මික ශිල්පී සංගමය, අංක 105/14, අත්තිඩිය පාර, රත්මලාන (සේවකයින් 50 දෙනා වෙනුවෙන්)

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ගාලුපාර, රත්මලාන.

අතර පවත්නා 2017.07.22 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ (වැඩ බලන) ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එස්. කාරියවසම් මහතා වෙත යොමු කරන ලදී.


1A – G 33099 – 15(2020/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දුන් පෙනී යන හෙයින් කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා එම නියෝගය අවලංගු කරන අතර, එකී 2017.07.31 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 07 වැනි දින,
කොළඹ දී ය.
10 - 1049/1

---

මගේ අංකය: IR/COM/04/E/2014/84.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

ජල පවිත්‍රාගාර කාර්මික ශිල්පී සංගමය, අංක 105/14, අත්තිඩිය පාර, රත්මලාන (සේවකයින් 50 දෙනා වෙනුවෙන්)

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ගාලුපාර, රත්මලාන.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතර, පඹුරණ, අබේගුණරත්න මාවත, අංක 10/A, ඒ. ඒ. වීරසූරිය මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/E/2014/84.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජල පවිත්‍රාගාර කාර්මික ශිල්පී සංගමය, අංක 105/14, අත්තිඩිය පාර, රත්මලාන (සේවකයින් 50 දෙනා වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ගාලුපාර, රත්මලාන.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පවිත්‍රාගාර කාර්මික ශිල්පී අභ්‍යාසලාභී තනතුර සඳහා බඳවාගත් මෙහි උපලේඛනයේ නම් සඳහන් සේවකයින් වසරක අභ්‍යාසලාභී කාලසීමාව අවසානයේ පවිත්‍රාගාර කාර්මික ශිල්පී තනතුරේ ස්ථිර නොකිරීමෙන් අසාධාරණයක් සිදු වී ඇත්ද යන්න හා එලෙස අසාධාරණයක් සිදු වී ඇත්නම් ඔවුන් එකිනෙකාට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.''

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 පෙබරවාරි මස 22 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

### උපලේඛනය

01. එච්.පී. ශනීර රංගන මයා
02. බී.එම්.ආර්.ටී.බී. බස්නායක මයා
03. කේ.එස්.ඩී. සෙනෙවිරත්න මයා
04. ඊ.එම්.අයි. උදයශාන්ත මයා
05. ඊ.එම්.සී.එස්.බී. ඒකනායක මයා
06. එම්.ආර්.එස්.ඩී. බණ්ඩාර මයා
07. වයි.එම්.මිලින්ද යාපා මයා
08. එල්.ඒ.පී. කුමාර මයා
09. ඒ.ඩී.ඩබ්.එස්. විමලවීර මයා
10. එච්.එල්.එස්. සඳරුවන් මයා
11. එච්.ඒ.අයි. උද්ධික මයා
12. එම්.එම්.එස්.අයි. විජයරත්න මයා
13. යූ.කේ.ඩී. සාරංග මයා
14. එම්.ආර්.සී. ලසන්ත මයා
15. ටී.එස්.මානවඩු මයා
16. වී.පී. නිමල්රත්න මයා
17. ජී.ඩබ්.ආර්. ප්‍රේමසිරි මයා
18. ඩබ්.එස්. ජයලත් මයා
19. ජේ.ඒ.සී.එන්. රණසිංහ මයා
20. එස්.එච්.පී.එච්. චන්ද්‍රසේන මයා
21. එන්.ඒ.ඩී.කේ. චන්ද්‍රසේන මයා
22. කේ.එම්. මාලක සංජීව මයා
23. යූ.ජී.ටී.එම්. ජයරත්න මයා
24. එම්.ඊ. ගනේවත්ත මයා
25. අයි.එම්.ටී.ඩී.ඉලංගකෝන් මයා
26. ඩබ්.එස්. රාජපක්ෂ මයා
27. ඩබ්.එම්.සී. උදයකුමාර මයා
28. පී.එම්.ඩී. කුමාර මයා
29. ඩබ්.එම්.එස්.අයි.බී.විජේසුන්දර මයා
30. ආර්.එම්.ජේ.කේ.රත්නායක මයා
31. ජී.ඩී.එන්.පී.ගොඩගම්පොල මයා
32. කේ.එම්.ටී.එස්. කුමාර මයා
33. ජී.කේ.ජී.පී.එස්.ඩබ්. ගමගේ මයා
34. ජී.ඒ.ඒ. ගමආරච්චි මයා
35. ඩී.එම්.එල්.පී.කේ. දිසානායක මයා
36. ඩබ්.ඒ.ඩී.යූ.කේ. වික්‍රමසිංහ මයා
37. යූ.ජේ.ජී. විජේරත්න මයා
38. ඩබ්. ඒ. ජයලත් මයා
39. යූ.එම්.සී. උදය කුමාර මයා
40. ඒ.ඒ.ජී.ආර්.ජේ. රත්නායක මයා
41. එස්.එම්.එන්.කේ. බණ්ඩාර මයා
42. බී.සී.හෙට්ටිආරච්චි මයා
43. ආර්.එම්.එන්. සිසිර කුමාර මයා
44. ඒ.එස්. සමරකෝන් මයා
45. එස්.ඒ.ටී. කුමාර මයා
46. පී. කසුන්ග පෙරේරා මයා
47. අමිල ප්‍රියමාන්න මයා
48. ජේ.ඒ.ඩී.ජී.ඩබ්. ජයසුන්දර මයා
49. එච්. රාජකරුනා මයා
50. ඩී. කත්‍රිආරච්චි මයා

මගේ අංකය : IR/COM/01/2016/176 .

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4 (1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2018.03.14 වැනි දින අංක 2062/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.03.08 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අයි.නිමල් කරුණාතිලක මයා, අංක 259, 5 වන පටුමග, උයන්දන වත්ත, මල්ලවපිටිය, කුරුණෑගල.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී.බී. ජයා මාවත, කොළඹ 10.

අතර පවත්නා 2018.01.20 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එස්. කාරියවසම් මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා එම නියෝගය අවලංගු කරන අතර, එකී 2018.03.08 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

10 - 1050/1

---

මගේ අංකය: IR/COM/01/2016/176.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අයි. නිමල් කරුණාතිලක මයා, අංක 259, 5 වන පටුමග, උයන්දන වත්ත, මල්ලවපිටිය, කුරුණෑගල.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී.බී. ජයා මාවත, කොළඹ 10

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පිලියන්දල, නාම්පමුණුව, කුමුදු මාවත, අංක 89/F, සුනෙත් ලොකුබෝගහවත්ත මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2016/176.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අයි. නිමල් කරුණාතිලක මයා, අංක 259, 5 වන පටුමග, උයන්දන වත්ත, මල්ලවපිටිය, කුරුණෑගල.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී.බී. ජයා මාවත, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවකයකු වූ අයි. නිමල් කරුණාතිලක මහතාට විරුද්ධව පවත්වන ලද විනය පරීක්ෂණයෙන් අනතුරුව පනවන ලද දඬුවම් යුක්ති සහගත ද යන්න සහ එසේ නොවේ නම් ඒ මහතාට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.''.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 මාර්තු මස 13 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

10 - 1050/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.